# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2137/39 - 2019 අගෝස්තු මස 20 වැනි අඟහරුවාදා - 2019.08.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 37/56(vi)

**1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ**

3 වන වගන්තිය යටතේ වූ නියමය

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 3 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න වන මම, 2018 අප්‍රේල් මස 10 වන දින අංක 18/0769/718/043 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රජයේ අනුමතය ඇතිව, මේ නියමය මගින්, ඉහත සඳහන් කරන ලද පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද 1987 ජූනි මස 04 වැනි දිනැති අංක 456/21 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ පළමුවන උපලේඛනය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ :-

**''පළමුවන උපලේඛනය**

මෙම සංස්ථාවේ අරමුණු -

(1) තමා විසින් ම හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයකට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුළත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම හෝ නැවත ඇසුරුම් කිරීම ;

(2) පාලිත සමාගම් නිර්මාණය කිරීම ;

(3) අනාගත ආයෝජකයන් සමග ජාත්‍යන්තර ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(4) ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම ;

(5) ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතිකරණය කිරීම ; සහ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(6) සංස්ථාව විසින්ම හෝ බද්ධ ව්‍යාපාර මගින් හෝ වෙනත් එවැනි ගිවිසුම් මඟින් නිපදවන ලද ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම

පරිදි විය යුතු ය.

මේ නියමයේ කාර්ය සඳහා ''ඖෂධ'' යන්නට, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ සඳහන් අර්ථයම ඇත්තේ ය.''

රාජිත සේනාරත්න,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2019 අගෝස්තු මස 13 වන දින,
කොළඹ දී ය.

09 - 59

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.